පරිගණක ලොව




# විවිධ තොරතුරු රැගත් නව පරිගණක තැටියක්

සමන්ත මල්ලවආරච්චි
සටහන

නාමාවලියක් කිවූ පමණින් සමහර විට ඔබට මතක් වන්නේ පිටු විශාල ප්‍රමාණයක් ඇති සමහරවිට අධික බරකින් යුත් මුද්‍රිත ප්‍රකාශනයක්. එවැනි නාමාවලියක වුවද සුවිශේෂී තොරතුරු විරල ය. පොදුවේ ඇති තොරතුරු විනා පරිබාහිරව එහි වෙනත් දෑ අඩංගු නොවේ. එහෙත් මේ සියල්ලට ම පිළිතුරු සපයමින් නවීන තාක්ෂණයේ පිහිටෙන් ඉතා සුවිශේෂී නාමාවලියක් නිකුත් කිරීමට ශ්‍රී ලාංකික සමාගමක් මේවන විටත් ලක ලැහැස්ති වෙමින් සිටියි. මුද්‍රිත මාධ්‍යයෙන් මෙතෙක් නිකුත් වූ නාමාවලිය පෙරළියකට හසුකරමින් **සංයුක්ත නාමාවලියක්** හෙවත් සංයුක්ත තැටියක සියලු දත්ත ඇතුළු කොට **කම්පැක්ට් ඩිරෙක්ටරියක්** මැයි මාසයේ දී ජනතාව අතරට පැමිණීමට නියමිත ය. මෙය **සයිබර් සර්ව්** නමින් නම් කොට ඇති අතර රත්මලානේ සීමාසහිත සයිබර් සර්ව් පුද්ගලික සමාගම මෙම අභියෝගාත්මක කර්තව්‍යයට අත ගසා තිබේ.

ශ්‍රී ලංකාවේ දත්ත, වෘත්තිමය දත්ත, විශ්වීය දත්ත, මූල්‍ය දත්ත වගේම හදිසි අවස්ථාවකදී දැනුම්දිය යුතු ස්ථාන හා එහි දුරකථන අංක වෙළෙඳ දැන්වීම් ආදිය ද සයිබර් සර්ව් හි අන්තර්ගත ය.

ප්‍රධාන මාතෘකාවක් ඔස්සේ අනු මාතෘකාවල ඇති දත්ත හඹා යාමට ඇති පහසුව මෙහි ඇති තවත් සුවිශේෂී ලක්ෂණයකි.

ලංකාවේ සිතියමක් ගත් කළ එහි දිස්ත්‍රික් සිතියම්, නාගරික සිතියම් මෙන් ම උප නගර සිතියම් ද ලබා ගත හැකි ය. දුරකථන අංකයක් ගත් කළ ප්‍රදේශ අනුව පුද්ගල නාමයන් අනුව දුරකථන අංක සොයාගත හැකි ය. එක් එක් වෘත්තීන්ට අයත් වෘත්තික නාමලේඛනයක් ද එහි ඇතුළත් කොට තිබේ.

කම්පැක්ට් ඩිරෙක්ටරියේ විශේෂාංග කිපයක් මෙසේ ය.

1. ව්‍යාපාරික හා පුද්ගල දුරකථන අංකයන්ට අමතරව වෙළෙඳ ආයතනයන්හි ෆැක්ස් අංක හා ඊ මේල් ලිපිනයන් කම්පැක්ට් ඩිරෙක්ටරියේ ඇතුළත් කර ඇත.

2. ලංකාව පිළිබඳ තොරතුරු විවිධ මාතෘකාවන් යටතේ මෙහි සඳහන් කර ඇත. මෙම තොරතුරු විදේශිකයන්ට මෙන් ම අධ්‍යාපනය ලබන්නටත් ද වැදගත් වන පරිදි පෙළගස්වා ඇත. මෙහි ලංකාවේ ඓතිහාසික තොරතුරු, දේශපාලනික තොරතුරු, ආර්ථිකමය තොරතුරු මෙන් ම සංචාරකයින් සඳහා (විදේශීය/ස්වදේශීය) ලංකාව තුළ නැරඹීම සඳහා ඇති පාරිසරික වැදගත්කමක් ඇති ස්ථාන, ඓතිහාසික වැදගත්කමක් ඇති ස්ථාන, විනෝද චාරිකා යා හැකි ස්ථාන, කොළඹ නගරයේ වැදගත් ස්ථාන, කෞතුකාගාර, වනෝද්‍යාන, දිය ඇලි, ප්‍රධාන නගර ආදී වැදගත් තොරතුරු රාශියක් මෙහි ඇතුළත් කර තිබේ.

3. ශ්‍රී ලංකාව තුළ සිටින වෘත්තිකයන් ගේ නාමාවලියක් මෙහි ඇතුළත් වේ.

යමෙකුට තම ප්‍රදේශයේ සිටින කිසියම් වෘත්තිකයකු හමුවීමට අවශ්‍යනම් එම තොරතුරු පහසුවෙන් ම මෙමගින් සොයාගත හැක. මෙහිදී ඉංජිනේරුවන්, වෛද්‍යවරුන්, ගණකාධිකාරවරුන්, නීතිඥයන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, තක්සේරුකරුවන් අදීන් ගේ දුරකථන අංක සහ ලිපිනයන් මෙහි ඇතුළත් කිරීමට බලාපොරොත්තු වේ.

4. ඕනෑම පුද්ගලයෙකුට එදිනෙද ජීවිතයේ අවශ්‍යවන කිරුම් මිනුම්, විදේශයන්හි භාවිත වන මුදල් වර්ග, වේලාවේ ඇති වන වෙනස්වීම්, දුම්රිය ගමන් කාල සටහන්, ගුවන් ගමන් පිළිබඳ තොරතුරු, පොලීසිය, ගිනි නිවන හමුදුව, රෝහල් ආදියෙහි දුරකථන අංක, මාධ්‍ය ආයතනවල දුරකථන අංක ආදී තවත් බොහෝ දෑ මෙයට ඇතුළත් වෙයි.

5. ශිෂ්‍යයනට වැදගත් වන ශ්‍රී ලංකාවේ සහ ලෝකයේ සිතියම් රාශියකද් මෙයට ඇතුළත්ය.

මෙයට අමතරව ව්‍යාපාරික ආයතනවල තොරතුරු ද (Company Profile) මෙහි ඇතුළත් කර තිබේ. ඒ ඒ ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලය, ව්‍යාපාරයේ ස්වභාවය, වත්කම් හා බැරකම් ප්‍රකාශනය, ලාභාලාභ ගිණුම්, ශේෂ පත්‍ර ආදිය ද ඇතුළත් වේ. මෙම ව්‍යාපාරික තොරතුරු කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත සමාගම්වල ආයෝජනය කරනු ලබන පුද්ගලයින්ට ඉතා විශාල පිටුවහලක් සපයයි.

පරිගණකයේ මෙම නාමාවලිය සම්පූර්ණයෙන් ගබඩා කිරීමට මෙගා බයිට්ස් 25 ක් පමණ වැයවන බව, පවසන සීමාසහිත සයිබර් සර්ව් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපති කුමුදු ඉන්දික මහතා රුපියල් 200-300 ත් අතර මිලකට මෙම සංයුක්ත නාමාවලිය වෙළෙඳ පොළට නිකුත් කිරීමට අපේක්ෂා කරන බව ද කීය.

ශ්‍රී ලංකාවේ ප්‍රථම වතාවට මේ නව ආකාරයේ නිර්මාණය එළිදක්වන බවත් දත්තවල සිදුවන වෙනස්වීම් අනුව වාර්ෂිකව මෙම නාමාවලිය සංශෝධනයන් සිදු කොට නිකුත් කිරීමට තම සමාගම අපේක්ෂා කරන බවත් සමාගමේ කළමණාකාර අධ්‍යක්ෂ ඩී. එම්. එස්. අටුගොඩ මහතා ප්‍රකාශ කරයි. ❑